# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/5 - 2018 අගෝස්තු මස 27 වැනි සඳුදා - 2018.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : 4/1/1/32-H, 147.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2016/HW/180.

පොදුජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් රජයට අත්කර ගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

*අත්කරගෙන ඇති ඉඩම්වල විස්තරය* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුණෑගල නගරය, අංක 830, මඩිතියවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගනේගෙදර ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු, අධිකාරි විසින් පිළියෙළ කරන ලද අංක කු 2356 හා 2018.07.24 දරන මූලික පිඹුරේ කැබලි අංක 267 හා 268 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4899ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි දෙක (02) :-

01. **කැබලි අංක 267**

ඉඩමේ නම : පිලලන්දේවත්ත *නොහොත්* හිටිනාවත්ත; ඉඩම් පරිහරණය : මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් පාන්නා : රජය; මුල් හිමිකම් පාන්නා : බෝයගනේ, ගනේගෙදර, ''සිරිනිවස'', හි පදිංචි එන්.ජේ.ඩී. ගනේගෙදර; ප්‍රමාණය : හෙක්ටයාර් 0.2948

02. **කැබලි අංක 268**

ඉඩමේ නම : පිලලන්දේවත්ත *නොහොත්* හිටිනාවත්ත; ඉඩම් පරිහරණය : මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් පාන්නා : රජය; මුල් හිමිකම් පාන්නා : බෝයගනේ, ගනේගෙදර, ''සිරිනිවස'', හි පදිංචි එන්.ජේ.ඩී. ගනේගෙදර; ප්‍රමාණය : හෙක්ටයාර් 0.1951

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමන්ගේ නම් *ගැසට් පත්‍රයේ* පළවී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි කරුණු පිළිබඳ විස්තරයක් 2018.09.10 දින මගේ කාර්යාලයේ දී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව, 2018.09.25 වැනි දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී තමන් විසින් නැතහොත් ලිඛිතව බලය පවරනු ලැබූ නියෝජිතයකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයක දී පනතේ 09 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතු ය.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 28361 - 27 (2018/08)

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ආර්. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 අගෝස්තු 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-223

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : 4/1/1/32-E.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2015/HW/69.

පොදුජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් රජයට අත්කර ගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

*අත්කර ගෙන ඇති ඉඩම් විස්තරය* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 836, කුරුණෑගල නගරය, අංක 808, වෙහෙරබැන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අම්බලන්පිටිය ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු, අධිකාරි විසින් පිළියෙළ කරන ලද අංක කු 2402 හා 2018.06.29 දින දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 04 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2930ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි හතර (04)

01. **කැබලි අංක 1**

ඉඩමේ නම : පරගහකොටුවේකුඹුර දැනට වත්ත; ඉඩම් පරිහරණය : විවෘත මුඩුබිම; හිමිකම් පාන්නා : රජය; මුල් හිමිකම් පාන්නා : කුරුණෑගල, නුවර පාර, රුවන් බෝධි මාවත, අංක 16/A, හි පදිංචි එල්. කේ. බී. එන්. වීරසිංහ; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0860

02. **කැබලි අංක 02**

ඉඩමේ නම : පරගහකොටුවේකුඹුර දැනට වත්ත; ඉඩම් පරිහරණය : මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත ; හිමිකම් පාන්නා : රජය; මුල් හිමිකම් පාන්නා : කුරුණෑගල, දුම්රිය ස්ථාන මාවත, අංක 31/2,හි පදිංචි ජේ. ඒ. නාලනී; ප්‍රමාණය : හෙක්ටයාර් 0.1080

03. **කැබලි අංක 03**

ඉඩමේ නම : දංගහමුලවත්ත; ඉඩම් පරිහරණය : මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි තුනක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් පාන්නා : රජය; මුල් හිමිකම් පාන්නා : කුරුණෑගල, අම්බලම්පිටිය, කොලපැලලිකන්ද වත්ත හි පදංචි ඩී. එම්. ඒ. එන්. දසනායක; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0452

04. **කැබලි අංක 04**

ඉඩමේ නම : දංගහමුලවත්ත; ඉඩම් පරිහරණය : මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම් පාන්නා : රජය; මුල් හිමිකම් පාන්නා : කුරුණෑගල, අම්බලම්පිටිය, පලිපානවත්තෙහි පදිංචි එච්. එම්. යසෝමැණිකා; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0538

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමන්ගේ නම් *ගැසට්පත්‍රයේ* පළවී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි කරුණු පිළිබඳ විස්තරයක් 2018.09.10 දින මගේ කාර්යාලයේ දී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2018.09.25 දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයකදී තමන් විසින්ම *නැතහොත්* ලිඛිතව බලය පවරනු නියෝජිතයකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයකදී පනතේ 09 වෙනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ආර්. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 අගෝස්තු මස 20 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-224

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.